## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය

### තනතුරු පුරප්පාඩු

## ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ලේකම් තනතුර සහ පර්යේෂණ නිලධාරී තනතුර සඳහා බඳවාගැනීම පිණිස අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ ලේකම් තනතුර සහ පර්යේෂණ නිලධාරී තනතුර සඳහා බඳවාගැනීම පිණිස පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### ලේකම් තනතුර

**අධ්‍යාපන සුදුසුකම්:**

1. **බාහිර අයදුම්කරුවන්** [ පහත (1) සහ (2)වන වගන්ති යටතේ සඳහන් වන සුදුසුකම් සපුරා තිබිය යුතුය.]

    (1) (අ) ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් නීතිය පිළිබඳව උපාධියක් ලබා තිබීම ;

    සහ

    (ආ) විශ්ව විද්‍යාල උපාධිය ලබාගැනීමෙන් පසුව තනතුර හා සම්බන්ධ අදාල විෂය ක්ෂේත්‍රයක යටත් පිරිසෙයින් එක් අවුරුද්දක පළපුරුද්දක්වත් ලබා තිබීම ;

    (2) පිළිගත් වෘත්තීමය වරලත් ආයතනයකින් අදාල විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධයෙන් මධ්‍යම මට්ටමේ පරීක්ෂණයක්වත් සමත් වී තිබිය යුතු අතර, තනතුර හා සම්බන්ධ අදාල විෂය ක්ෂේත්‍රයක යටත් පිරිසෙයින් එක් අවුරුද්දක පළපුරුද්දක්වත් ලබා තිබීම ;

2. **අභ්‍යන්තර අයදුම්කරුවන්**

    ඉහත සඳහන් කළ පරිදි, බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලීම අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම ;

**වෙනත් සුදුසුකම් :**

(අ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්පත් කැඳවනු ලබන මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි, අයදුම්පත් බාරගැනීමේ අවසාන දිනය වන විට සියළුම අයදුම්කරුවන් සෑම ආකාරයකින්ම ඉහත සඳහන් කළ සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(ඇ) සෑම අයදුම්කරුවකුම මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**වයස :**
අයදුම්පත් බාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45 නොඉක්ම විය යුතුය. එසේ වුවද, උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සම්බන්ධයෙන් අදාළ නොවේ.

**වැටුප් පරිමාණය :**

**එම්එම් 1-3- 2016 රුපි.( 55,925 –10 *1375 –15*1910-98,325.00)**

ඉහත කී වැටුප් පරිමාණය වර්ෂ 2016 සිට වර්ෂ 2019 දක්වා වන කාලසීමාව සඳහා පියවර හතරකට අදාළ වේ. සම්පූර්ණ වැටුප් පරිමාණය 2020 වර්ෂයේ දී ක්‍රියාත්මකවනු ලැබේ.

| ශ්‍රේණිය | 2018 වර්ෂයේ දී අදාළ වන මූලික වැටුප් පියවර (රුපි.) |
|---|---|
| එම්එම් 1-3 | 44,343.00 |

වෙනත් ප්‍රතිලාභ :

ජීවන වියදම් දීමනාව / රජය විසින් අනුමත කරන වෙනත් දීමනා ගෙවනු ලැබේ.

රැකියා විස්තරය:

ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයාගේ සෘජු අධීක්ෂණය යටතේ පහත සඳහන් රාජකාරී ඉටුකළ යුතුය.

1. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන් සහ අධ්‍යක්ෂවරයා සමඟ මනා සම්බන්ධීකරණයක් ගොඩනගාගනිමින්අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීම් සහ සාකච්ඡා කාර්යක්ෂම අන්දමින් සංවිධානය වන බවට වගබලා ගැනීම ;

2. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට සහභාගී වීම, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ලබාගැනීම සහ යතුරුලියනය කිරීම සහ න්‍යාය පත්‍ර, වාර්තා සහ අනුමත රැස්වීම් වාර්තා සකස්කොට නිලධාරීන් අතර බෙදාහැරීම ;

3. දේශීය සහ විදේශීය ලියකියවිලි, වාර්තා, මැමෝ පත්‍ර, ලිපි, සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ඒවා සම්බන්ධයෙන් නිසි පරිදි වාර්තා තබාගෙන බෙදාහැරීම සහ ආයතනයේ ඉටුකිරීමට තිබෙන වැඩකටයුතු සම්බන්ධයෙන් පසු විපරමින් කටයුතු කිරීම;

4. සියළුම රජයේ දෙපාර්තමේන්තු,අමාත්‍යාංශ, අදාළ දේශීය සහ විදේශීය අරමුදල් සම්පාදන නියෝජිතායතන සහ අනෙකුත් ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් යුක්තව කටයුතු කිරීම ;

5. ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ සහ අධ්‍යයන සම්බන්ධීකාරකවරයාගේ අධීක්ෂණය යටතේ පුහුණුවීම්වලට පහසුකම් සලසා ගැනීම පිණිස සංචාර සහ හෝටල් කල්වේලා ඇතිව වෙන්කර ගැනීම ඇතුළුව මධ්‍යගතවපළාත් සහ විදේශීය වශයෙන් සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු සහ ශාස්ත්‍රීය සම්මේලන සංවිධානය කිරීම ;

6. රජයේ, රජයේ නොවනනිසි බලයලත් නිලධරයන් හෝ නිලධාරීන් සහ විදේශ අධිකරණ අධ්‍යයන ආයතන සහ අරමුදල් සම්පාදන සංවිධාන සම්බන්ධයෙන් සහ ආයතනයේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රයෝජනවත් වන ඇමතුම් විස්තර යාවත්කාලීන කොට පවත්වා ගැනීම;

7. ආයතනයේ අනාගත කටයුතු ඇතුළුව ආයතනයේ කටයුතු හා සම්බන්ධ වාර්තා තබාගැනීම;

8. ආයතනයේ අධ්‍යක්ෂවරයා විසින් නියම කරන පරිදි සහ නියම කරන අවස්ථාවලදී ආයතනයේ අනෙකුත් පරිපාලන කටයුතුවලට සහාය ලබාදීම ;

<u>පර්යේෂණ නිලධාරී තනතුර</u>

## අධ්‍යාපන සුදුසුකම්:

**බාහිර අයදුම්කරුවන්**

ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ සාමාන්‍ය උපාධියක් ලබා තිබීම සහ අධ්‍යයන හෝ පර්යේෂණ හෝ නීති ක්ෂේත්‍රෙය් යටත්පිරිසෙයින් එක් වසරක (01) පළපුරුද්දක් සහිතව ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතීඥවරයකු වීම ;

**අභ්‍යන්තර අයදුම්කරුවන්:**

ඉහත සඳහන් කළ පරිදි, බාහිර අයදුම්කරුවන් විසින් සපුරාලීම අවශ්‍ය වන සුදුසුකම් ලබා තිබීම ;

වෙනත් සුදුසුකම් :

සෑම අයදුම්කරුවකුම,

i ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය

ii තනතුරේ රාජකාරී මනාව ඉටුකිරීම පිණිස කායික සහ මානසික යෝග්‍යතාවයෙන් පසුවිය යුතු වන අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකියාව තිබිය යුතුය.

iii මනා චරිතයකින් යුක්ත විය යුතුය.

**වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, වයස අවුරුදු 45 නොඉක්ම විය යුතුය.

වැටුප් පරිමාණය

**ඒආර් 1-2016 රුපි.( 51,285 –5x1135 –5x1335-15x1590-87,485)**

ඉහත කී වැටුප් පරිමාණය වර්ෂ 2016 සිට වර්ෂ 2019 දක්වා වන කාලසීමාව සඳහා පියවර හතරකට අදාළ වේ. සම්පූර්ණ වැටුප් පරිමාණය 2020 වර්ෂයේ දී ක්‍රියාත්මක වනු ලැබේ.

| ශ්‍රේණිය | 2018 වර්ෂයේ අදාළ වන මූලික වැටුප් පියවර (රුපි.) |
|---|---|
| ඒආර් 1, II | 40,661.00 |

වෙනත් ප්‍රතිලාභ :

ජීවන වියදම් දීමනාව / රජය විසින් අනුමත කරන වෙනත් දීමනා ගෙවනු ලැබේ.

**රැකියා විස්තරය :**

1. මහාධිකරණ විනිශ්චයකාරවරයන්, දිසා විනිසුරුවරුන්, මහේස්ත්‍රාත්වරුන්, කම්කරු විනිශ්චය සභා සභාපතිවරුන්, අළුතින් බඳවාගන්නා විනිශ්චයකාරවරුන් සහ අධිකරණ රෙජිස්ට්‍රාර්වරුන් / අධිකරණ කාර්ය මණ්ඩලය සඳහා විද්‍යුත් පුස්තකාලය සහ වෙනත් ක්‍රමෝපායන් හරහා කාර්යක්ෂම, ඵලදායී සහ වෘත්තීමය පර්යේෂණ සහ නීතිමය තොරතුරු සේවා සම්පාදනය කිරීම;

2. ශ්‍රී ලාංකික විනිශ්චයකාරවරයන්ගේ වෘත්තීමය ප්‍රමිතීන් වැඩිදියුණු කිරීම පිණිස ආයතනයේ පර්යේෂණ කාර්යභාරයන් ආයතනය විසින් ඵලදායී අන්දමින් සිදුකිරීමට හැකිවන පරිදි ආයතනයේ අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා, උපදේශකවරුන්, අධ්‍යයන සම්බන්ධීකාරකවරයා, පුස්තකාලයාධිපතිවරයා, රජයේ වෙනත් නියෝජිතායතන, විශ්ව විද්‍යාල සහ වෙනත් පුස්තකාල සමඟ සම්බන්ධීකරණය ගොඩනගා ගැනීම;

3. ආයතනයේ පුහුණු සැසිවාරවලදී ආයතනයේ කාර්ය මණ්ඩලය සහ විනිශ්චයකාරවරුන් භාවිත කිරීම පිණිස පාඨමාලා ආශ්‍රිත අත්පොත් ද්‍රව්‍ය, සිද්ධි අධ්‍යයන ලේඛන, සුවිශේෂී දත්ත සංහිතා සකස් කිරීමට සහ අදාළ නෛතික තොරතුරු හඳුනාගැනීම සහ බැහැරින් සම්පාදනය කිරීම සඳහා සහාය දැක්වීම;

4. පර්යේෂණ කටයුතු ඉටුකිරීම සහ විනිශ්චයාසන ආශ්‍රිත පොත් යාවත්කාලීන කිරීම පිණිස පත්කරන කමිටුවට සහාය දැක්වීම;

5. පර්යේෂණ කටයුතු ඉටුකිරීම සහ විනිශ්චයකාරවරයන්ගේ අත්පොත් යාවත්කාලීන කිරීමට පත්කරන කමිටුවට සහාය දැක්වීම;

6. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පළකිරීමට නියමිත වානිජ නීති වාර්තා සකස් කිරීම උදෙසා ප්‍රධාන සංස්කාරකවරයාට සහ සහකාර සංස්කාරකවරයාට සහාය දැක්වීම;

7. ශ්‍රී ලංකා විනිශ්චයකාරවරුන්ගේ ආයතනයේ තොරතුරු ජාලය සහ දත්ත සංහිතාව යාවත්කාලීන කිරීම ;

8. වාර්තා නොකළ නඩු තීන්දු සඳහා ශීර්ෂගත සටහන් සකස් කිරීම;

9. තව ද,

   අ) ආයතනයේ විද්‍යුත් පුස්තකාලය සංවර්ධනය කිරීමට දායක වීම සහ ආයතනයේ පරමාර්ථ සපුරාලීම පිණිස අධිකරණ විසින් මෙහෙය වන විවිධ වර්ගයේ නඩු සම්බන්ධයෙන් පර්යේෂණ කටයුතු ඇරඹීම,

   ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ සහ මහාධිකරණයේ වාර්තා නොකළ නඩු තීන්දු සම්බන්ධයෙන් විද්‍යුත් පුස්තකාලය යාවත්කාලීන කිරීම, සහ

   ඇ) ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට, අධිකරණ සේවා කොමිසන් සභාවට සහ වෙනත් අදාළ නියෝජිතායතනවලට ඉදිරිපත් කිරීම පිණිස පර්යේෂණ වාර්තා සකස් කිරීම,

යනාදිය තුළින් ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ පර්යේෂණමය අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස නීති පර්යේෂණ වැඩසටහන් සහ ව්‍යාපෘති ආශ්‍රිත කළමනාකාරීත්වයට දායකත්වය ලබාදීම;

**තනතුරුවලට බඳවාගැනීමේ කාර්යපටිපාටිය**

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීමෙන් අනතුරුව එහි දී ලබාගන්නා ලකුණු අනුපිළිවෙල මත බඳවාගැනීම සිදුකරනු ලැබේ.

**සේවා කොන්දේසි**

1. මෙම තනතුරු වසර තුනක පරිවාස කාලයකට යටත්ව ස්ථිර තනතුරු වේ.

2. සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදලට දායකමුදල් ගෙවිය යුතුය. ඒ අනුව, සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන් 8% ක දායක මුදල් ගෙවිය යුතු වන අතර, සේවා යෝජකයා විසින් 12% ක දායක මුදල් ගෙවිය යුතුය. තව ද, සේවකයා විසින් සිය වැටුපෙන් 3% ක් සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

**අයදුම්කිරීමේ පටිපාටිය :**

අයදුම්කරු විසින්ම සකස් කරගන්නා අයදුම්පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට 2018.03.12 වන දිනට හෝ එදිනට පෙර මෙහි පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය. නිසි පරිදි සම්පූර්ණ නොකරන ලද අයදුම්පත්‍ර සහ මෙම නිවේදනයේ සඳහන් අයදුම්පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැලේ දී නැතිවූ බවට සඳහන් කරමින් අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

මේ සම්බන්ධයෙන් පෞද්ගලිකව ලබාදෙන දුරකථන ඇමතුම් හෝ වෙනත් පෞද්ගලික මට්ටමේ ඇමතුම් කිසිවක් භාරගනු නොලැබේ.

**අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනය,**
**අංක 80, අධිකරණ මාවත,**
**කොළඹ 12.**

**2018.02.06**